නාට්‍යමය පෙළපාලි

කොහොඹා කංකාරියේ එන නාට්‍යමය පෙළපාලි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් බොහෝ නර්තන කොටස් බෙර වාදනයන්, කවි ගායනා ආදිය ඇතුළත් කර මෙම ශාන්ති කර්මයෙහි රංග කලාව හදාරන සිසු දරුවන්ට වැදගත් වන්නේ එහි එන නාට්‍යමය පෙළපාලි හෙවත් අන්තර් රංග අවස්ථාය .එනම් කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නාට්‍ය අනුසාරයෙන් ඉදිරිපත් කිරීමයි. එවන් අවස්ථා කීපයක් කොහොඹාකංකාරියේ ඇත. ඒවා නම්

- 1 ඌරා යක්කම
- 2 නයා යක්කම
- 3 වැදි යක්කම
- 4 ගුරුගේ මාලාව
- 5 ගබඩා කොල්ලය

නයා යක්කම

මින් ඉදිරිපත් කරන්නේ සෝලිය ගුරු නැමැත්තෙකු ට දානය දීම සඳහා සම්මාදමේ ගොස් කළමනා එක්රැස්කර දානය පිළියෙළ කර රැගෙන යන අතුරතුර දී සිදුවන සිදුවීමකි. එහිදී යක්දෙස්සා හා ආවතේවකරු සුදු රෙදි කඩක් රැගෙන සම්මාදමේ යන අයුරු අනුකරණය කෙරෙයි.. අනතුරුව යාග භූමිය මත එලා ඇති පැදුරෙ වාඩි වී සම්මාදම ට ලැබූ බඩු තෝරා බේර ලැබුණු වී කෙටීම වී පෙලීම, ලිප් ගල් බැඳීම හාල් ගැරීම බත් පිසීම ආදී ක්‍රියා අනුරූපණ යෙන් ඉදිරිපත් කරයි කවියක් ලෙස

ලාසක විතර වී අච්චේ වනාලා

දොළසක් විතර පෙති ගෝමර ඉසී ලා

අතක් දිගට නිල් වරලස මුදාලා

කතක් සිටිති වී අච්චේ වනාලා

දැක්විය හැකිය. ඉන්පසු පිසගත් දානය දන් කදක දමා සෝලිය ගුරු වෙත රැගෙන යන අතර මගදී දැනෙන මහන්සිය නිසා ගසක් මුල වාඩි වී ගිමන් හරී. දන් සුවඳට අසල පිහිටි

තුඹසක සිටි නාගයෙක් දන්කද තුළට රිංගා ගනී. ඉන්පසු නාගයා ඇදුරාට දෂ්ය කිරීමත් ඉන්පසු නාග විෂ බැස්සවීම සඳහා නොයෙක් විහිලු හා මන්තර කවි කීමත් අවසානයේ රෝගියා සුවපත් වන ආකාරයත් නිරූපනය වේ

## ඌරා යක්කම

මෙම අවස්ථාව නිරූපණය කරන්නේ මලය රජ්ජුරුවන්ගේ උයන පාළු කළ ඌරා සොයා කැලේට යාමත් කැලේ දී අල්ලාගන්නා ඌරා මරා මස්කර ගමේ පවුල්වලට බෙදා දීමේ අවස්ථාවකි.මෙහිදී යක්දෙස්සා හා සහායකයා දුණු ඊතල, කෙටෝ්රිය රැගෙන ඌරා සොයා කැලේට යති .ඔවුහු අතරමගදී දකින ලේනා, කටුස්සා ඉබ්බා, කබරගොයා, වඳුරා ආදී නොයෙක් සතුන්ට ඌරායැයි රැවටෙති .ටික වේලාවකින් කෙසෙල් බඩ වලින් තනන ලද ඌරෙක් යාග භූමියේ දක්නට ඇත. ඔවුහු ඊයෙන් විද ඌරා මරා මස්කර ගමේ කුල අනුව බෙදා දෙන අයුරු අනු කරමින් ඉදිරිපත් කරති. පහත දැක්වෙන්නෙ ඌරා යක්කමේ සංවාදයකි .

යක්දෙස්සා _ අනේ බොලං මම උදැල්ලේ මාස ගානක් ඇවිදිනවා

බෙරකරු -උදැල්ලේ නෙවෙයි බං නිදැල්ලේ.

යක්දෙස්සා _නිදැල්ලේ අන්න හරි

- බෙරකරු_ අනේ බොලං මොකටද ඔච්චර කල් ඇවිත්දේ
- යක්දෙස්සා _මලේ රජ්ජුරුවන්ගේ උයන පාළු කරපු හූරා හොයන්න
- බෙරකරු_ හූරා නෙමෙයි බොලං ඌරා
- යක්දෙස්සා_ ඒක තමයි

## වැදි යක්කම

මෙම අවස්ථාවෙන් නිරූපණය කරන්නේ කැලෙන් වැද්දෙක් රැගෙනවිත් ඔවුන් නාවා පිරිසිදු කර ආහාරපාන සපයා ඔවුන් සතුටු කර ඔවුන් ලවා ආතුරයින්ට සෙත් කරවා ආපසු කැලයට පිටත් කර හැරීමයි. නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමකි. මෙම අවස්ථාවට පැදුරක්, දුන්න ,ඊතල, අඹ අත්තක් ,නව කොළ අතු මිටියක්, පුවක් මල් කිනිත්තක් ආදී බොහෝ මෙවලම් භාවිතා කරයි. ඇදුරෝ වැද්දන් සේ සමාරෝපණය වීමට ඉනෙහි කොළ අතු එල්ලා ගෙන සිටී.

## ගුරුගේ මාලාව

මී න් දැක්වෙන්නේ නල්ලසාදි ගුරු නැමැති විදේශිකයාට සිංහල භාෂාව කතා කර ගැනීමට නොහැකි වීම හාස්‍යයට හා උපහාසයට ලක්කිරීමයි. යක්දෙස්සන් නල්ලසාදී ගුරු ලෙස හිසේ සිට රෙද්දක් පොරවාගෙන නැඹිලියට බත්මාලාව ගෙන බෙරකරු සමඟ සංවාද කරයි. එහිදී ගුරු පවසන්නේ බත් මාලාවේ අඩුපාඩු සම්පූර්ණ කළහොත් තමා මෙහි සිටින ආතුරයා ඇතුළු පිරිසට සෙත් කරන බවයි. යක්දෙස්සා බත් මාලාවේ

අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු නල්ලසාදී ගුරු සැමට සෙත්පතා පෙළපාලිය අවසන් කරයි .ඔහු සෙත් කරන්නේ මෙසේය .

ගීත  කෙරේ  _ගීත නාද කෙරේ

ගීත නාද කෙරේ

මේ ආතුර දෝෂ කරේ

දෝෂ දුරු කෙරේ..........

ගබඩා කොල්ලය

කොහොඹා කංකාරිය පැවැත්වීම සඳහා අවශ්‍ය හාල් පොල් කෙසෙල් තැඹිලි බුලත් විවිධ තැඹිලි වර්ග පොල්තෙල් ආදී කළමනා සියල්ල එක් රැස් කර තබා ගැනීම සඳහා කංකාරි භූමිය පසෙකින් මඩුවක් ඉදි කරනු ලබයි .එහි ඇති භාණ්ඩ ආරක්ෂා කිරීමට ගබඩා භාරකරුවෙක් ද පත් කරයි.ඇතෙක් ලෙස සමාරෝපය වන ඇදුරෙකු ලවා මෙම ගබඩාවේ දොර කඩා විවෘත කර බලා එහි තිබූ භාණ්ඩ අඩු වී ඇතැයි පවසා ප්‍රධාන යක්දෙස්සා ගබඩා භාරකරුට දඩයක් නියම කරයි. භාරකරු බොහෝ කේවල් කිරීමෙන් පසු එම දඩය බුලත් අතක් හා පඬුරක් දක්වා අඩු කර ගැනීමට සමත්වේ. ඉන්පසු ගබඩාවේ ඉතිරි වී ඇති ද්‍රව්‍ය සියල්ල ගම්වැසියන්ට රැගෙන යාමට ඉඩහැර ගබඩාව ගිනි තබා විනාශ කරන බව සංකේතාත්මකව නිරූපණය කරයි.

මීට අමතරව සිතා යක්කම, දර්ශන යක්කම යන අන්තර් රංග අවස්ථා ද මෙම ශාන්තිකර්මයේ දක්නට ඇති අතර ඒවා වර්තමානයේ භාවිතයේ නැත. කොහොඹාකංකාරියේ ඉහත කී අන්තර් රංග අවස්ථාවල නාට්‍යමය පෙළපාලි වල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ බොහෝමයකි. ඒවා නම්

- කිසියම් කතාවක් සිද්ධියක් මුල් කරගෙන පෙළපාලි නිර්මාණය වී තිබීම .
- ඇදුරෝ සංවාද( දෙබස් )භාවිතා කිරීම .
- රංග භූමියක් භාවිතා කිරීම.
- ජීවී ප්‍රේක්ෂක සහභාගිත්වය තිබීම.
- අනුකරණ හා අනුරූපණ අවස්ථා තිබීම
- ඇදුරෝ විවිධ චරිත වලට සමාරෝපය වීම
- රංග භාණ්ඩ භාවිතා කිරීම
- බෙර වාදනය මගින් පසුබිම් සංගීතය තිබීම
- පසුතල සැරසිලි නිර්මාණ තිබීම.

ඉහතින් දක්වන ලද නාට්‍යමය පෙළපාලි හා ඒවායේ ඇති නාට්‍යමය ලක්ෂණ දේශීය නාට්‍ය කලාවක් බිහි කිරීමට පුරෝගාමී වූ අනුකරණාත්මක ලක්ෂණ ලෙස විද්වතුන්ගේ පිළිගැනීමයි.

පැවරුම

ඉහත දක්වන ලද නාට්‍යමය ලක්ෂණ කොහොඹාකංකාරියේ නාට්‍යමය පෙළපාලි උදාහරණයට ගනිමින් විස්තර කරන්න.